ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2023-10-31 |

පැමිණිලි පාර්ශවය : ඩී.කුරුප්පුගේ මහතා,
අංක : 82/බී, කෝන්ගහවිල පාර,
දාම්පේ, මීගොඩ.

දෙනවකගේ සුජිත් කුමාර - අගතියට පත් පාර්ශවය

වගඋත්තර පාර්ශවය : පො.කො.76300 තරිඳු සංජීව පෙරේරා,
පොලිස් ස්ථානය,
මත්තේගොඩ.

පැමිණිලි අංකය : HRC/2919/20

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ සහෝදරියගේ ස්වාමි පුරුෂයා වන දෙනවකගේ සුජිත් කුමාර යන අය උපතින් ගොළු තැනැත්තෙකු බවත්, ඔහු මාර්ග සංවර්ධන අධිකාරියේ කැස්බෑව වැඩ ඒකකයේ කම්කරුවෙකු වශයෙන් සේවයේ නිරතව සිටින බවත්, 2020.11.25 වන දින උදෑසන 9.30 ට පමණ පිළියන්දල නගරයේ මාර්ගය දෙපස තණකොළ කැපීමේ කටයුතු වල යෙදී සිටියදී, එකවරම යම් පුද්ගලයෙකු ඔහුට දැඩි ලෙස පහරදී ඇති බවත්, එම තැනැත්තා පිළියන්දල පොලිස් ස්ථානයේ සේවය කරන පෙරේරා නැමති නිලධාරියෙක් බවට හඳුනාගෙන ඇති බවත්ය.

මෙම අවස්ථාව වනවිට දෙනවකගේ සුජිත් කුමාර යන අය නිසි පරිදි මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබූ ජැකට් එක පැළඳ සිටි බවත්, එසේ තිබියදී කිසිදු හේතුවක් නොමැතිව මෙම පුද්ගලයාට අතින් හා පයින් පහරදීම නිසා දෙනවකගේ සුජිත් කුමාර යන අයව පිළියන්දල රෝහල වෙත රැගෙන ගොස් ඇති බවත්, පසුව ඔහුගේ තත්ත්වය බරපතල බැවින්, කළුබෝවිල රෝහල වෙත මාරු කර යැවූ බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ල තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරියාටද පසුදින එනම්, 2020.11.26 දින දැනුම්දුන් බවත්, නමුත් ඔහු ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත් බවත්ය. පසුදින මේ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා පැමිණිලිකරු පිළියන්දල පොලිස් ස්ථානයට ගිය බවත්, එහිදී මෙය පොලිස් නිලධාරින් සම්බන්ධ කටයුත්තක් බැවින් ස්ථානාධිපති මුණගැසෙන ලෙසට එම අවස්ථාවේදී පොලිස් ස්ථානයේ සිටි නිලධාරින් විසින් දන්වා සිටි බවත් සඳහන් කරයි. පසුව ස්ථානාධිපතිවරයා හමුවූ බවත්, මෙම සිද්ධිය ගොඩින් බේරා ගන්නා ලෙසට ඔහු විසින් ප්‍රකාශ කළ බවත් පැමිණිල්ලේ සඳහන් වේ.

**පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි :-**

මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරුවෙකු ලෙස සේවය කරන මාපා මුදියන්සේලාගේ අනුරසිරි, අංක 110, 3 වන පටුමග, නිවන්තිඩිය, පිළියන්දල යන අය කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ, තමා මාර්ග සංවර්ධන අධිකාරියේ කැස්බෑව වැඩ ඒකකයේ කම්කරුවෙකු ලෙස සේවය කරන බවත්, 2020.11.25 දින සුජිත් කුමාර හා තවත් කම්කරුවන් පිරිසක් සමඟ පිළියන්දල මහරගම පාරේ බින්දුව සිට එක දක්වා ප්‍රදේශයේ දෙපස කැලෑව ඉවත් කරමින් සිටින විට සුජිත් කුමාර යන අය අපහසුවෙන් පැමිණ මාර්ගයේ යන අයෙකු පෙන්වා එම අය විසින් තමාට පහරදුන් බවට සංඥා මාර්ගයෙන් දන්වන ලද බවත්, එම ස්ථානයේ රැඳී සිටි අයෙකු විසින් එම පුද්ගලයා පිළියන්දල පොලිස් ස්ථානයේ පෙරේරා නැමැති නිලධාරියෙකු බවට ප්‍රකාශ කළ බවද සඳහන් කර ඇත.

මාර්ග සංවර්ධන අධිකාරියේ කැස්බෑව ඒකකයේ සේවය කරන අංක 451/බී, වැව පාර, කහතුඩුව, පිළියන්දල ලිපිනයේ පදිංචි රූපසිංහ ආරච්චිලාගේ සෝමදාස යන අය කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් තමා මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන බවත්, 2020.11.25 දින සුජිත් කුමාර යන අය සහ තවත් කම්කරුවන් පිරිසක් සමඟ මහරගම පාරේ බින්දුව සිට එක දක්වා ප්‍රදේශය දෙපස කැලෑව ඉවත් කරමින් සිටියදී දෙනවකගේ සුජිත් කුමාර යන අය අපහසුවෙන් පැමිණ මාර්ගයේ යන අයෙකු පෙන්වා එම අය තමාට පහරදුන් බවට සංඥා මාර්ගයෙන් දන්වන ලද බවයි. එම ස්ථානයේ රැඳී සිටි අයෙකු විසින් එම පුද්ගලයා පිළියන්දල පොලිස් ස්ථානයේ පෙරේරා රාළහාමි බවට හඳුන්වා දුන් බවද දක්වයි.

අංක 158/2/ඒ, නිවන්තිඩිය, පිළියන්දල ලිපිනයේ පදිංචි පී.එම්.නාලක චෙරංග මොහොට්ටාල යන අය කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ලබාදී ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ තමා මාර්ග සංවර්ධන අධිකාරියේ කැස්බෑව ඒකකයට අනුයුක්තව කම්කරුවෙකු ලෙස සේවය කරන බවත්, 2020.11.25 දින තමා සුජිත් කුමාර හා තවත් කම්කරුවන් පිරිසක් සමඟ පිළියන්දල - මහරගම මාර්ගයේ බින්දුව සිට එක දක්වා ප්‍රදේශයේ කැලෑව ඉවත් කරමින් තණකොළ කපන මැසිමෙන් තණකොළ කපමින් සිටි බවත්, තමාගේ සහයකයා ලෙස සුජිත් කුමාර යන අය කටයුතු කළ බවත්, ඔහු වීදුරු බෝතල් හා ගල් ඉවත් කරමින් ඉදිරියට ගමන් කළ බවත්, ටික වේලාවකින් සුජිත් කුමාර යන අය තමා වෙත පැමිණ යම් පුද්ගලයෙකු පහරදුන් බවට සංඥා මාර්ගයෙන් පැවසූ බවත්, එම පුද්ගලයා ඈතට යන බවට තමා දුටු

බවත්, එම පුද්ගලයා නිල් පැහැති බොටම් කලිසමක් සහ පොලිස් නිලධාරීන් හැඳ සිටින නිල් පැහැති ටී ෂර්ට් එකක් ඇඳ සිටි බවත්, තමා ඔහු පසුපස ගොස් ඔහු නැවැත්වීමට උත්සාහ කළ නමුත් ඔහු එම ස්ථානයේ තිබූ පාසලක් තුළට ගමන් කළ බවත්, පසුව තමා එම ස්ථානයේ සේවය කළ කාර්මික නිලධාරියාට දැනුම්දුන් බවත්, පසුව එම නිලධාරියා පාසලට ගොස් ඒ බව විමසීමේදී අදාළ පුද්ගලයා පොලිස් නිලධාරියෙක් බවට හඳුනාගත් බවත් දක්වා ඇත.

**අගතියට පත් දෙනවකගේ සුජිත් කුමාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව :-**

අදාළ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති කෙටි ඉතිහාසයේ දක්වා ඇත්තේ, 2020.11.25 දින උදෑසන 9.00 ට පමණ පාරේ වැඩ කරමින් සිටියදී පොලිස් නිලධාරියෙකු තමාට අතින් සහ පයින් පහරදීමක් කළ බවයි.

වෛද්‍ය වාර්තාවේ පහත පරිදි බරපතල නොවන තුවාල දෙකක් ඇති බව සඳහන් වේ.

01. Pain in touch (Tenderness)over the back aspect of the left shoulder joint. X-ray(No-0070482) of left shoulder joint show there were no underlying bone fracture.

02. Pain in touch (Tenderness)over the back aspect of mid third of the left thigh. X-ray(No-0070482) of left thigh shows there were no underlying bone fracture.

අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ, රෝගියා විසින් ලබාදී ඇති කෙටි ඉතිහාසය තුවාල වල ස්වභාවය සමඟ ගැලපෙන බවයි.

මේ සම්බන්ධයෙන් පිළියන්දල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, එම වාර්තාව මඟින් දක්වා ඇත්තේ, දෙනවකගේ සුජිත් කුමාර නැමති අයට 2020.11.25 වන දින තණකොළ කපමින් සිටියදී යම් පුද්ගලයෙකු දැඩි ලෙස පහරදී ඇති බවට හා ඒ හේතුවෙන් ඔහු ඇදවැටී ඇති අතර, එම පහරදුන් පුද්ගලයා පොලිස් නිලධාරියෙක් බවට හඳුනාගත් බවට දිනේෂ් කුරුප්පුගේ නැමැති අයකු එනම් මෙම පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානය වෙත දන්වා ඇති බවයි.

පහරදුන් පුද්ගලයා පිළියන්දල පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරමින් සිටි පොලිස් නිලධාරියෙක් වන පො.කො. 76300 පෙරේරා යන අය බවත්, මෙම පැමිණිල්ල පොලිස් නිලධාරියෙකුට විරුද්ධව සිදුකර ඇති පැමිණිල්ලක් බැවින්, ගල්කිස්ස දිසාව - 1 භාරව කටයුතු කළ පොලිස් අධිකාරි වෙදගේ මහතා විසින් විමර්ශන කටයුතු සිදුකළ බවත් දක්වා ඇත. මෙම සිද්ධියට අදාළව ඉහත පොලිස් කොස්තාපල්වරයාට ස්ථාන මාරුවක් ලබාදී ඇති බවත්, දැනට ඔහු මත්තෙගොඩ පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරන අතර, මේ සම්බන්ධයෙන් පිළියන්දල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් සිදුකර නොමැති බවත් තවදුරටත් දක්වා ඇත.

වගඋත්තරකාර පො.කො. 76300 තරිඳු සංජීව පෙරේරා යන අයගේ කරුණු දැක්වීම :-

පො.කො තරිඳු සංජීව පෙරේරා යන අය 2022.11.29 දින කොමිෂන් සභාව ඉදිරියේ පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ, තමා ඒ වනවිට පිළියන්දල පොලිස් ස්ථානයේ ප්‍රජා පොලිස් ඒකකයේ සේවය කළ බවත්, මෙම පැමිණිල්ලට අදාළ සිද්ධිය වූ දිනය තමාට මතක නොමැති නමුත් සිද්ධිය මතක බවත්, මෙම වකවානුවේ කොරෝනා වසංගතය පැවති අතර, තමා පිළියන්දල සෝමවීර හරිස්චන්ද්‍ර පාසල දෙසට පැමිණෙන අවස්ථාවේදී පාසලේ සිට මීටර් 50 - 100 අතර දුරින් පාසල පැත්තට වන්නට වම් පැත්තේ කාර් රථයක් නවතා තිබූ බවත්, මෙම අය (පරීක්ෂණ අවසථාවේදී කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටින අහතියට පත් තැනැත්තා) මන්නයක් අතැතිව මුඛආවරණයක් පැළඳ එම නවතා තිබූ කාර් රථය වටේ කැරකි කැරකි සිටි බවත්, එම අවස්ථාවේදී තමා මෙම පුද්ගලයාගෙන් එම ස්ථානයේ කුමක් කරන්නේ ද යන්න විමසූ නමුත්, ඔහු විසින් ඊට කිසිදු පිළිතුරක් ලබානොදුන් බැවින්, තමා නැවත වතාවක් ඔහුගෙන් එම ප්‍රශ්නයම ඇසූ බවත්, ඊට ද කිසිදු පිළිතුරක් නොදුන් බවත්ය. ඉන්පසුව තමා විසින් ඔහු මන්නය අල්ලාගෙන සිටි අතින් අල්ලා ගෙන කාර් රථය පරීක්ෂා කළ බවත්, එම කාර් රථයේ කිසිදු පුද්ගලයෙකු නොසිටි බවත් පවසයි. පසුව මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ කරමින් සිටි සේවකයෙක් එම ස්ථානයට පැමිණ මෙම පුද්ගලයා ආර් ඩී ඒ එකේ වැඩ කරන කෙනෙක් බවත්, ඔහු ගොළු පුද්ගලයෙකු බවටත් තමා වෙත ප්‍රකාශ කළ බවත්, ඉන්පසු තමා එම ස්ථානයෙන් පිටව ගිය බවත් දක්වා ඇත. ඉන්පසුව තමා පාසලට ගිය බවත්, පසුව තමාට විරුද්ධව ගොළු පුද්ගලයෙකුට පහරදීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී ඇති බවට දැනගන්නට ලැබුනු බවත් සඳහන් කර ඇත.

පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරිවරයා විසින් විමර්ශනයක් කළ බවට තමා පිළිගන්නා බවත් දක්වා ඇති අතර, කොමිෂන් සභාව විසින් අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් වන තුවාල සම්බන්ධයෙන් විමසීමේදී වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ ඒ සම්බන්ධයෙන් තමා කිසිවක් නොදන්නා බවයි.

**නිරීක්ෂණ :-**

2022.11.29 දින පෙරවරු 1.30 ට කොමිෂන් සභාවේ ඉදිරියේ පැවති පරීක්ෂණයේ දී අහතියට පත් දෙනවකගේ සුජිත් කුමාර යන අය ගොළු පුද්ගලයෙකු බවත්, ඔහු කොමිෂන් සභාව වෙත හස්ත සංඥා මාර්ගයෙන් ප්‍රකාශ කර සිටින්නේ, එදින වගඋත්තරකරුවෙකු ලෙස නම් කර පැමිණ සිටි පො.කො. 76300 තරිඳු සංජීව පෙරේරා යන අය තමාට පහරදුන් තැනැත්තා බවයි.

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් මාපා මුදියන්සේලාගේ අනුරසිරි යන අය සහ රූපසිංහ ආරච්චිලාගේ සෝමදාස යන අය විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ මඟින් දක්වා ඇත්තේ, අහතියට පත් තැනැත්තාට පුද්ගලයෙකු පහරදුන් බවත්, ඒ බව සංඥා මාර්ගයෙන් ඔවුන් දෙදෙනාට ප්‍රකාශ කළ බවත්,

පහරදුන් පුද්ගලයා එම ස්ථානයෙන් ඉවත්ව යන අවස්ථාවේදී, එම පහරදුන් පුද්ගලයා පිළියන්දල පොලිස් ස්ථානයේ පෙරේරා නැමති නිලධාරියා බවට එම ස්ථානයේ සිටි පුද්ගලයන් ප්‍රකාශ කරන ලද බවත් ය.

- ඒ අනුව වගඋත්තරකරු එම සිද්ධියට අදාළ පුද්ගලයා බවට තහවුරු වේ.

- පැමිණිල්ලට සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති පී.එම්.නාලක වෙරංග මොහොට්ටාල විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය අනුව, අහතියට පත් තැනැත්තා සංඥා මාර්ගයෙන් පුද්ගලයෙකු ඔහුට පහරදුන් බවට තමාට දැන්වූ බවත්, එම පුද්ගලයා එම ස්ථානයෙන් යනවිට තමා විසින් ඔහුව නැවැත්වීමට උත්සාහ කළ බවත්, එම පුද්ගලයා පාසල තුළට ගිය බවත්, ඔහු නිල් පැහැති බොටම් එකක් සහ පොලිසිය විසින් ලබාදෙන නිල් පැහැති ටී ෂර්ට් එකක් ඇඳ සිටි බවත් සඳහන් කර ඇති අතර, එමඟින් අදාළ පහරදුන් පුද්ගලයා පොලිස් නිලධාරියෙකු බවට නිරීක්ෂණය වේ.

- පිළියන්දල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ වාර්තාව තුළින් ද මෙම සිද්ධියට අදාළ වගඋත්තරකාර පොලිස් නිලධාරියාව පරීක්ෂණයකින් පසුව පිළියන්දල පොලිස් ස්ථානයේ සිට වෙනත් පොලිස් ස්ථානයට මාරු කර ඇති බවට දක්වා ඇති අතර, එමඟින් ද මෙම සිද්ධිය තහවුරු වන බවට නිරීක්ෂණය වේ.

- පහරදීමෙන් පසුව අහතියට පත් අය රෝහල් ගත කර ඇති අතර, රෝහලේ දී අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට භාජනය කර ඇත. එම අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ද බරපතල නොවන තුවාල දෙකක් ඇති බවට දක්වා ඇති අතර, එමඟින් ද පහරදීමක් සිදුව ඇති බවට නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිල්ලේ ඉදිරිපත් වී ඇති සාක්ෂි මත සහ පිළියන්දල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ කරුණු වාර්තා කිරීම තුළින් පැමිණිල්ලේ සඳහන් කරුණු තහවුරු වීමක් සිදුවන අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවේ අධිකරණ වෛද්‍යවරයාගේ මතය අනුව රෝගියා විසින් තමා වෙත ඉදිරිපත් කර ඇති රෝග ඉතිහාසය සහ රෝගියාගේ තුවාල වල ස්වභාවය ගැලපෙන බවට දක්වා ඇති බැවින් වගඋත්තරකරු විසින් අහතියට පත් දෙනවකගේ සුජිත් කුමාර යන අයට පහරදී ඇති බවට තහවුරු වේ. ඒ අනුව වගඋත්තරකරු විසින් දක්වන පරිදි අගතියට පත් දෙනවකගේ සුජිත් කුමාර යන අයගේ අතින් අල්ලා කාර් රථය පරීක්ෂා කිරීම පමණක් කළ බවට කරනු ලබන කරුණු දැක්වීම පිළිගත නොහැක.

ඒ අනුව, <u>**SC FR 672/12** ඉෂාරා අංජලී එරෙහිව වර්ණ බෝගහවත්ත නඩුවේදී නීතිය බලාත්මක කරන නිලධාරීන් මානව ගරුත්වයට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සහ සියළු පුද්ගලයන්ගේ මානව හිමිකම්</u>

පවත්වාගෙන යාමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බවත්, එසේම එම නිලධාරීන් නිත්‍යානුකූලභාවයෙන් කටයුතු කළ යුතු අතර, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව කටයුතු කළ යුතු බවත්, විශේෂයෙන්ම බාල වයස්කරුවන්, රෝගීන්, මහළුඅය සහ වෙනත් විශේෂ අවශ්‍යතාවයන් සහ විශේෂ තත්ත්වයන් ඇති අයවළුන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත්, අදාළ මානව හිමිකම් තත්ත්වයන් කඩ නොවන ලෙස කටයුතු කළ යුතු බවත් දක්වා ඇත.

අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු නඩුවේදී දක්වා ඇත්තේ, කිසියම් තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 ව්‍යවස්ථාව මඟින් විධානය කර ඇති පරිදි යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. තවද, යම් අපරාධකරුවකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, මෙම අයිතිවාසිකම ආරක්ෂා කිරීමට රජයේ වගකීමක් දරණ අංශයක් වන පොලිස් බලකායට වුවද කිසියම් අවස්ථාගත කරුණක් යටතේ වුවද එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරු මෙම පහරදීම සිදුකර ඇත්තේ, උපතින්ම ගොළු විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයෙකුට වන අතර, එවැනි පුද්ගලයෙකුට මෙවැනි පහරදීමක් සිදුකිරීම තුළින් වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් ආරක්ෂා කර ඇති කිසිදු පුද්ගලයෙකු වධහිංසාවකට හෝ කෲර අවමන් සහගත සැලකීමට හෝ දඬුවමකට භාජනය නොවිය යුතුය යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

01. ඉහත කරුණු සියල්ල අනුව, පොලිස්පතිවරයා විසින් වගඋත්තරකාර පො.කො. 76300 තරිඳු සංජීව පෙරේරා නැමති නිලධාරියා සම්බන්ධයෙන් විනයානුකූලව කළ යුතුය.

02. අගතියට පත් දෙනවකගේ සුජිත් කුමාර යන අයට වගඋත්තරකාර නිලධාරියා විසින් රු. 10,000/- ක වන්දි මුදලක් ලබා දිය යුතුය.

2025.11.30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී දෙහිදෙණිය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),<br>සභාපති,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | නිමල් ජී. පුංචිහේවා,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත :- 01. ටිරාන් අලස් මහතා,
අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ, - අදාළ නිලධාරී වෙත නිර්දේශය යොමු කිරීමට
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
~~මානව හිමිකම් කොට්ඨාශය,~~
අංක : 07, 7 වන මහල, කොටා ටෙරස්
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් අගතියට පත් පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් මානව හිමිකම් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/